# සකුරා මල් ඔස්සේ සොබාදහමේ විශ්‍රාන්තිය

ඒ. එම් ඒ. සී. අලහකෝන්

වචනය පාදක කොට ගත් කලා මාධ්‍යයන් අතර කාව්‍යය පමණ මිනිස් සිත ප්‍රබෝධමත් කරවන අන්‍ය කලා කාර්යයක් නැති තරම් ය. කාව්‍යය මගින් මිනිස් සිත තුළ පහළ වන සියුම් හැඟීම් ඉතා ප්‍රබල ලෙස සොබාදහම හරහා විස්තර වී ඇත. ජපන් හයිකු කාව්‍යය" වනාහි ජපන් සංස්කෘතියට ආවේණික වූ සුවිශේෂ කාව්‍ය සම්ප්‍රදායකි. අවුරුදු 500ක පමණ ඉතිහාසයකින් යුත් හයිකු කාව්‍යය ජපන් සාහිත්‍යයේ පමණක් නොව මුළු ලෝක සාහිත්‍යයේ ම හමුවන කෙටිම කාව්‍යය සම්ප්‍රදායයි "ජපන් හයිකු කාව්‍යය" කොටස් 3කින් යුක්තය. ජපන් හයිකු කාව්‍යය ප්‍රවේශය, පැරණි ජපන් හයිකු කාව්‍යය සංග්‍රහය, නූතන ජපන් හයිකු කාව්‍යය සංග්‍රහය යනුවෙනි. මෙම කොටස් ත්‍රිත්වය ශතවර්ෂ 5ක පමණ කාලයක් තුළ කවීන් 106 දෙනෙක් අතින් නිර්මිත වූ හයිකු පද්‍ය 1054කින් මෙම ග්‍රන්ථය සමන්විතය. ප්‍රවීණ සාහිත්‍ය විචාරකයෙකු හා කෘතහස්ත පරිවර්තකයෙකු වන මහාචාර්ය ආරිය රාජකරුණා විසින් සම්පාදනය කෙරුණු මෙම කෘතිය මගින් ජපානයේ දිවි ගෙවූ මෙම කතුවරුන් සොබාදහම හරහා ලද විශ්‍රාන්තිය මනාව පිළිබිඹු වේ.
දීර්ඝ සංචාරයක යෙදීමෙන් වෙහෙසට පත්වී සිටි කවියා රෑ බෝ වීමෙන් පසුව නවාතැන්පළක් සෙවීමෙහි නිරත වෙයි. එවිට ඔහුට මල් පිපුණු ෆූජි ගසක් ඇස ගැටෙයි. සිය මානසික හා ශාරීරික වෙහෙස නිවා ගැනීමට ඉන් ඔහුට මහත් අනුබලයක් ලැබෙයි.

"සංචාරයක දී විඩාවට පත්ව
නවාතැන්පලක් සොයන අතර
මල් පිපුණු ෆූජි ගසකි!"
"වසන්ත ඍතුවේ වර්ෂාවට
කුඩා ළමයෙකුගේ බෝලයක්
වහල උඩ තෙමී තෙමී තිබිණි."
"සකුරා මල් කිනිත්තක්
අතින් රැගෙන
ඔංචිල්ලාව පදින ළමයෙකි."
පැරණි ජපන් හයිකු කාව්‍යයේ 399ක් පද්‍ය අතරින්......
"වන්දනාකරුවන්ගේ සැරයටි පමණක්
ග්‍රීෂ්ම ඍතුවේ තණ පඳුරු සහිත මිටියාවත දිගේ
ගමන් කරන්නාක් මෙනි"

මිටියාවතෙහි උසට වැවී තිබුණ තණ පඳුරු හේතුකොටගෙන නරඹනන්ට වන්දනාකරුවන් නොව ඔවුන්ගේ සැරයටි පමණක් ගමන් කරන්නාක් මෙන් පෙනේ."උත්සවශ්‍රීයෙන් යුතු වසන්ත ඍතුවයි.... පිදුරු පැදුරක් පොරවාගෙන යන තැනැත්තා කවරෙක්ද?"-31-
වසන්ත ඍතුවේ දිනක විනෝද වන ජනතාව අතර.... හිඟන්නෙකි. මෙයින් විශ්‍රාන්තිය තුළින් යථාර්ථය අවබෝධයට කවියා සමත් විය."සකුරා නැරඹීමට පැමිණි පිරිසක් සන්ධ්‍යා නාදයත් නිසා කවියාගේ හුදකලාව පහවයයි.... වසන්ත කාලයේ සකුරා මල් පිපී තිබීම නැරඹීමට පැමිණි අය.... අලංකාර ඇඳුමින් සැරසී මල් පිපුණු සකුරා ගස් වටේ සිට.... විනෝදයෙන් කල් ගෙවති...."-121-
"හිරුගඹ මල් වැල අසල - පිටි කොටන්නා සිසිල් සුවයක් විඳිමින් සිටියි..."- 56-.....ගල් වැහි සහිත කුණාටුවක් හමා යනු දුටු විට ළමා මනසේ විශාන්තිය....මුතු ඇට වර්ෂාව ළමයිනි එන්න, අපි දුව පැන නටමු..."
හුදෙකලා ජීවිතයට සොබාදහමේ විශ්‍රාන්තිය මේ කෘතියෙන් ජනිත කෙරේ.

ආරිය රාජකරුණා (2002), ප්‍රථම මුද්‍රණය, පරිවර්තනය ජපන් හයිකු කාව්‍යය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675 මරදාන පාර කොළඹ 10